# සමකාලීන ග්‍රාමීය සමාජ ව්‍යුහයෙහි ආගමික නැඹුරුතාවයෙහි ස්වරූපය

නිලූෂා දැල්පිටිය[1]

## හැඳින්වීම

අතීතයේ සිටම ග්‍රාමීය සමාජය ආගමානුකූල පරිසරයකින් සමන්විත වනු දක්නට ලැබේ. විශේෂයෙන්ම වැවයි දාගැබයි ගමයි පන්සලයි යන සංකල්පය තුලින් ද ප්‍රකාශ වන්නේ ග්‍රාමීය සමාජය තුල ආගම හා බැඳී පවතින සබඳතාවේ ස්වරූපයයි. සාම්ප්‍රදායික සමාජය දෙස හොඳින් විමසා බැලීමේ දී එහි සියලු ක්‍රියාකාරකම් කෙරෙහි ආගමික නැඹුරුතාවය හොඳින් විද්‍යාමාන වේ. නමුත් පසුකාලීන සමාජ සංකීර්ණත්වයට පත්වීමත් සමග ආගමික ක්‍රියාකාරකම් වලින් මිනිසා බැහැර වීමක් හඳුනාගත හැකිවේ. විශේෂයෙන්ම මෙම තත්ත්වය සමකාලින ග්‍රාමිය සමාජයන්හී පුලුල්ව දක්නට ලැබේ. ඒ අනුව මෙම ලිපිය මගින් සමකාලීන ග්‍රාමිය සමාජ ව්‍යුහයේ ආගමික නැබුරුතාවය සාකච්ඡාවට ලක්කරනු ලැබේ.

උපතේ සිට මිනිසාගේ සියළු ක්‍රියාකාරකම් කෙරෙහි ආගම විසින් දක්වන්නාවූ බලපෑම හා දායකත්වය ද සුවිශාල වේ. එමෙන් ම ආගම හා ජන ජීවිතය අතර පවත්නාවූ  සම්බන්ධතාවය වෙන්කළ නොහැකි අවියෝජනීය සම්බන්ධතාවයක් ලෙසට හඳුනාගත හැකි වේ. ග්‍රාමීය ජන ජීවිතයේ දී විශේෂයෙන් ම මිනිසාගේ සියලුම ලෞකික කටයුතු සඳහා ආගම ප්‍රබල ලෙස බලපෑම් කරන ලදි. ග්‍රාමීය පන්සල යනු බහුකාර්ය මධ්‍යස්ථානයක් වූ අතර එහිදී අධ්‍යාපනය, නායකත්වය, වෙදකම, දානමාන, අවමඟුල් මෙන්ම මිනිසාගේ ආධ්‍යාත්මික ගුණ වගාව වර්ධනයෙහිලා ආගමික සංස්ථාවේ කාර්යභාරය පුළුල් විණි. එපමණක් නොව ග්‍රාමීය ජනයාගේ ආර්ථික ක්‍රියාවලිය වටා ද ආගමික චාරිත්‍ර වාරිත්‍රයන් අනුගමනය කිරීමක් ද දක්නට ලැබුණි. වගා කටයුතුවලට පෙර සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනා කිරීම් දෙවියන් උදෙසාවන භාරහාරවීම් අස්වනු නෙළීමෙන් පසු කිරි ඉතිරිවීම් මෙන් ම අලුත් සහල්වලින් දානමාන රැගෙන ඒම් ආදී ග්‍රාමිය ජනයාගේ ආගමික දායකත්වයන් දක්නට ලැබුණි.

නමුත් මෙම ආගමික සංස්ථාව වටා බැඳුණු ග්‍රාමීය පරිසරය සමාජ නවීකරණයත් සමග විපර්යාසයන්ට භාජනයවන ආකාරය හඳුනාගත හැකි වේ. විශේෂයෙන්ම 1978 විවෘත ආර්ථිකයත් සමග මෙරට සමාජ ආර්ථික ව්‍යුහය එතෙක් පැවති සාම්ප්‍රදායික ලක්ෂණයන් වෙනස්කම්වලට භාජනයවනු දක්නට ලැබේ. මුදල මත පදනම් වූ වටිනාකම් තීරණයවන සමාජයක් නිර්මාණය වූ අතර සාම්ප්‍රදායික සමාජයන් හී වැඩි වැදගත්කමක් ලබාදුන් කාර්යන් හා චාරිත්‍ර විධීන් බැහැර කරවීමක් ද මේ අනුව හඳුනාගත හැකි විණි. කෙසේ වුව ද තවමත් ග්‍රාමීය සමාජ ව්‍යුහයෙහි සරල ජීවන රටාව සංකීර්ණත්වයට පරිවර්තනයට ලක් කරවමින් පැවතිය ද තම ක්‍රියාකාරකම් කෙරෙහි ආගමික චාරිත්‍රයන් බද්ධ කර ගැනීම

---

1 සමාජවිද්‍යා අධ්‍යනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, niludalpitiya@gmail.com

අත්නොහැර ඇති බව පැහැදිලි වේ. ඒ අනුව ග්‍රාමීය සමාජ සන්දර්භයෙහි ශක්තිමත්ව පැවතුණා වූ ආගමික සම්බන්ධතාවයන් සමාජ නවීකරණය තුළ ලිහිල් වූ බවක් හඳුනාගත හැකි විණි. ඒ අනුව මෙම අධ්‍යයනය මගින් නූතන ග්‍රාමීය සමාජ සන්දර්භය තුළ ආගමික නැඹුරුතාවෙහි ස්වභාවය පිළිබඳව විශ්ලේෂණයක නිරත වීම සිදු වේ. එනම් වත්මන් ග්‍රාමීය සමාජයෙහි ආගමික නැඹුරුතාවය කවරාකාර ස්වරූපයකින් ක්‍රියාත්මක වන්නේ ද යන්න මෙහිදී විමර්ශනයකට භාජනය කරන ලදි.

**ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය සඳුන්පුර ප්‍රදේශය ආශ්‍රිතව සිදුකරන ලද අතර දත්ත රැස් කිරීම සඳහා සරල සසම්භාවී නියදිම් ක්‍රමය ඔස්සේ අධ්‍යයනයට අදාළ නියදිය සකස් කර ගන්නා ලදි. ඒ අනුව දත්ත රැස් කිරීමේදී ප්‍රාථමික දත්ත හා ද්විතියික දත්ත යොදාගත් අතර ප්‍රාථමික දත්ත රැස්කිරීම සඳහා ප්‍රශ්නාවලිය, නිරීක්ෂණ හා සම්මුඛ සාකච්ඡා යොදාගන්නා ලදි. අධ්‍යයනය ප්‍රදේශය අම්පාර දිස්ත්‍රික්කයේ දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයට අයත් සඳුන්පුර ප්‍රදේශය යොදාගන්නා ලදි. විශේෂයෙන් ම මෙම ප්‍රදේශය වියලි කලාපයට අයත්වන අතර බහුතරයක් කෘෂි කර්මාන්තය මුල් කරගත් ප්‍රජාවක් දක්නට ලැබේ. එමෙන් ම ප්‍රදේශයේ බහුතරයක් බෞද්ධ ආගම අදහනු දක්නට ලැබෙන අතර තවමත් නාගරික බවට අවම වශයෙන් ලක් වූ ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැකි වේ.

**සොයාගැනීම් සහ නිගමනයන්**

අධ්‍යයනයට අනුව මෙම ප්‍රදේශයෙහි හඳුනාගත් ප්‍රධාන ලක්ෂණය වන්නේ මිනිසුන් ස්වකීය ආර්ථික කටයුතු සාධනය ප්‍රමුඛ කාර්යක් ලෙස සලකා කටයුතු කරන ආකාරයයි. අතීතයේ මෙන් නොව වර්තමානයේ අසීමිත අවශ්‍යතාවයන් නිර්මාණය වී පැවතීම හේතුකොටගෙන එම සංකීර්ණ අවශ්‍යතා සාධනය උදෙසා වැඩි කාලයක් මිඩංගු කිරීම හේතු කොට ගෙන අතිරේක ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය අවම වී ඇති බව පෙනේ. එනම් ඔවුන්ගේ කාලයෙන් වැඩි ප්‍රමාණයක් තම ජීවිකාව උදෙසා යොදවන බව පෙනේ. ඊට එහා ගිය විනෝදාස්වාදී හෝ ආගමික කටයුතු උදෙසා කාලය මිඩංගු කිරීම අවම බවක් හඳුනාගත හැකි වේ. එමෙන්ම පුරුෂ පාර්ශ්වය මෙන්ම කාන්තා පාර්ශ්වය ද තම වගා කටයුතුවල නිරතවීම නිසා ආගමික කටයුතුවලට දායකත්වය සැපයීම මගහැරී ඇති බව හඳුනාගත හැකි වේ. තරුණ ප්‍රජාව ආගමික සම්බන්ධතාවලින් මුළුමනින් ම ඉවත් වූ කොටසක් ලෙස හඳුනාගත හැකි වේ. විවිධ රැකියා සඳහා ප්‍රදේශයෙන් ඉවත් වී අගනගරය කරා සංක්‍රමණය වී ඇති තරුණ කොටස් දක්නට ලැබෙන අතර ඇතැම් තරුණ කොටස් ස්වකීය කාලය ඵලදායි කර්තව්‍යයක නිරත නොවී ගෙවාදමන ආකාරය හඳුනාගත හැක. ගමේ වැඩිහිටි හෙවත් වයෝවෘද්ධ පිරිස් පමණක් සියලු ම පොහෝ දිනන්හී සිල් සමාදන් වීම් වැනි ආගමික කාර්යන් හී නිරතවන අයුරු දක්නට ලැබෙන අතර මේ පිරිස ගමේ ජනගහනයෙන් ඉතා සීමිත කොටසක් ලෙස හඳුනාගත හැකි වේ.

මෙහි දක්නට ලැබෙන තවත් විශේෂ ලක්ෂණයක් වන්නේ ප්‍රදේශයේ ජනතාවගෙන් බහුතරයක් වෙසක්, පොසොන් හා ඇසල වැනි ප්‍රමුඛලා සලකන ආගමික පොහෝ දිනයන් හී පමණක් තම ආගමික වතාවත් සඳහා විහාරස්ථානය කරා ඇදීයන අතර සෙසු පොහෝ දිනයන් හී ආගමික වත්පිළිවෙත් සඳහා විහාරස්ථානය කරා ඇදීයාමේ අවම බවක් දක්නට ලැබේ. එමෙන් ම ඉරිදා දිනයෙහි පවත්වනු ලබන දහම් පාසල් අධ්‍යාපනය සඳහා ද ළමුන්ගේ සහභාගීත්වය දුර්වල මට්ටමක දක්නට ලැබේ. ඒ සඳහා බෙහෙවින් ම හේතු වී ඇත්තේ ළමුන් උපකාර පන්ති සඳහා සහභාගී වීමයි. එමෙන්ම දහම් පාසල් අධ්‍යාපනය සඳහා විධිමත් ගුරුවරු නොසිටීමත් ඉහළ ශ්‍රේණි සඳහා ප්‍රමාණවත් ගුරුවරු නොසිටීමත් ළමුන් දහම් පාසල් අධ්‍යාපනයෙන් බැහැරවී තිබේ. එමෙන් ම සෘජුව ම නවීකරණයේ ප්‍රතිඵලයන් හේතු කොටගෙන ද ප්‍රජාව විහාරස්ථානය හා බැඳුණු ආගමික සංස්ථාවෙන් ඉවත් වී යන අයුරු හඳුනාගත හැකි වේ. රූපවාහිණිය, ගුවන්විදුලිය, සීඩී තැටි හරහා ආගමට අදාළ කටයුතු, සාකච්ඡා නිතර දක්නට ලැබීම හරහා විහාරස්ථානයට නොගොසින් නිවසේදී ම ආගමික වතාවත් හී නිරතවනු දක්නට ලැබේ.

**සාරාංශය**

මේ අනුව අතීතයේ බහුකාර්ය ආයතනයක් වූ විහාරස්ථානය වර්තමානය වන විට ප්‍රජාවගේ දාන, අවමංගල්‍ය වැනි ඇතැම් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා පමණක් යොදාගන්නා ස්ථානයක් බවට පරිවර්තනය වෙමින් පවතින බව නිගමනය කළ හැකි වේ. සමාජ නවීකරණය තුළ මිනිසා තම පෞද්ගලික අපේක්ෂා සාධනයට ප්‍රමුඛත්වය හිමිකර දීම හේතුකොටගෙන තම ආගමික අවකාශය හකුළා දැමීමක නිරතවන අයුරු හඳුනාගත හැකි වේ.

**ප්‍රමුඛ පද**: නවීකරණය, විවෘත ආර්ථිකය, ආගමික අවකාශය, සංකීර්ණ සමාජය

**ආශ්‍රිත ග්‍රන්ථ**

Gombrich, Richard F.(1971). *Precept and practice: traditional Buddhism in the rural highlands of Ceylon.* Oxford: Clarendon Press.

Karunadasa, Y. (1989). *Buddhist analysis of Matter*. Singapore: Buddhist Research Society.

*Wickramasinghe, J. W. (2008).* The Buddha, The peerless economist: People, friendly Buddhist economics. *Colombo: S. Godage*

ධර්ම කීර්ති, දෙනගම. (1991). *ලක්දිව බුදුසසුන හා මහ සඟ රුවන.* කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

ගුණසිංහ, නිව්ටන්, 2000. සංසයාගේ සංබෙතාත්මක භූමිකාව, ප්‍රවාද, සංස් ජයදේව උයන්ගොඩ, කුමාරි ජයවර්ධන සහ රංජිත් පෙරේරා, කොළඹ: සමාජවිද්‍යාඥයින්ගේ සංගමය.